ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

# 1980 අංක 55 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 12 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1980 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිල : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1980 අංක 55 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 91/79.

**1972 අංක 7 දරන ගෙවල් කුලී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 55 දරන ගෙවල් කුලී (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **1972 අංක 7 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(4) යම් ප්‍රදේශයක මේ පනත ක්‍රියාත්මකව පවත්නා තාක් කල් මේ පනතෙහි විධිවිධාන—

(අ) බැහැර කළ ස්ථානයක්;

(ආ) 1980 ජනවාරි මස 1 වන දිනට පසුව ඉදි කරනු ලැබ, එදින හෝ එදිනට පසුව කුලියට දෙන ලද නිවාස ස්ථානයක්;

(ඇ) 1980 ජනවාරි මස 1 වන දින අයිතිකරු පදිංචිව සිට, එදින හෝ එදිනට පසුව කුලියට දෙන ලද නිවාස ස්ථානයක්;

(ඈ) (i) ආගාමික හා විගාමික පනත යටතේ වලංගු වීසා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තාවූ ද මාසයකට රුපියල් එක් දහසක් ඉක්මවන මුළු ආදායමක් ලබන්නාවූ ද තැනැත්තකු; හෝ

(ii) නේවාසික නොවන සමාගමක්

විසින් පදිංචිව සිටින හා මේ උපවගන්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි හෝ එදිනට පෙර, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ සමාගමට කුලියට දෙනු ලැබ එහි ගෙහිමියා විසින් කරන ලද ඉල්ලීමක් මත, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් එම කරුණු පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු, මේ පනත අදාළ වීමෙන් බැහැර කරනු ලැබූ නිවාස ස්ථානයක්; සහ

(ඉ) (i) ආගාමික හා විගාමික පනත යටතේ වලංගු වීසා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තාවූ ද මාසයකට රුපියල් එක් දහසක් ඉක්මවන මුළු ආදායමක් ලබන්නාවූ ද තැනැත්තකු; හෝ

2002 4/ම 26

(ii) නේවාසික නොවන සමාගමක්

වෙත මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමෙන් පසු කුලියට දී ඇත්තාවූ ද, ඒ කුලියට දීම සම්බන්ධයෙන් එහි ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයාගේ පූර්ව අනුමතය ලබාගෙන ඇත්තාවූ ද, එහි කලින් සිටි කුලී නිවැසියා, සිය කැමැත්තෙන් ම හෝ අධිකරණයේ ආඥාවක් මත හෝ ඒ ස්ථානයෙන් ඉවත් වූ බවට ඒ කොමසාරිස්වරයා සෑහීමට පත්වින්නේ නම් ඒ අනුමතය දිය යුතු වූ ද නිවාස ස්ථානයක්

නොවන ඒ ප්‍රදේශයේ සියලු ස්ථාන සම්බන්ධයෙන් අදාළ විය යුතු ය;

තව ද පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "ස්ථානය" යන වචනය මේ පනතෙහි යෙදෙන කවර හෝ තැනක මේ පනත අදාළ වන ස්ථානයක් ලෙස එය අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු අතර, "නිවාස ස්ථානය" සහ "ව්‍යාපාර ස්ථානය" යන යෙදුම් ද ඒ අනුව අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි—

(අ) "1980 ජනවාරි මස 1 වන දිනට පසුව ඉදි කරන ලද නිවාස ස්ථාන" යන යෙදුමෙන්—

(i) පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටියා වූ ද ඉදිකිරීම, ජලාපවහනය සහ වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් නීතියට අනුකූල බවට වූ අනුකූලතා සහතිකයක් 1980 ජනවාරි මස 1 වන දිනට පසුව, නිවාස හා නගර සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදානය කරනු ලැබ ඇත්තා වූ ද නිවාස ස්ථානයක්; හෝ

(ii) අනුකූලතා සහතික නිකුත් නොකරන පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක පිහිටියා වූ නිවාස ස්ථානයක් වන්නා වූ ද ඒ නිවාස ස්ථානය පිහිටීයේ යම් පරිපාලන කොට්ඨාසයක ද ඒ පරිපාලන කොට්ඨාසයේ උපදිසාපතිවරයා විසින් 1980 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ඒ ස්ථානය පදිංචියට ගැනීම පිණිස සුදුසුම්ව තිබූ බවට, 1980 ජනවාරි මස 1 වන දිනට පසුව නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් ප්‍රදානය කර ඇති නිවාස ස්ථානයක් වන්නා වූ ද නිවාස ස්ථානයක්

අදහස් වේ;

(ආ) "නේවාසික නොවන සමාගම" යන යෙදුමෙන්—

(අ) සමාගම් ආඥාපනතේ IX වන කොටස අදාළ වන සමාගමක්; හෝ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ නිදහස් කරන ලද සමාගමක්; හෝ



(ඇ) සමාගමේ කොටස් හිමියන්ගෙන් හෝ අධ්‍යක්ෂවරයන්ගෙන් බහුතර සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවෙහි නේවාසිකයන් නොවන අවස්ථාවක සමාගම් ආඥා පනත යටතේ "පවත්නා සමාගමක්" ලෙස පිළිගෙන ඇති සමාගමක්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද, ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තන් විසින් පාලනය සහ කළමනාකරණය කරනු ලබන්නා වූ ද, ස්වකීය ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටියාවූ ද සමාගමක්

අදහස් වේ.'.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියෙහි (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) යම් ස්ථානයක ගෙහිමියා විසින්—

(අ) මේ පනත ආරම්භවීමේ දිනයෙහි හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලසීමාවක් වෙනුවෙන් ඒ ස්ථානයේ ගෙවල් කුලිය වශයෙන්, මේ පනතේ කාර්ය සඳහා 6 වන වගන්තියෙහි විස්තර කෙරෙන ඒ ස්ථානය සඳහා වූ නියමිත ගෙවල් කුලියට අධික වූ යම් මුදලක් ඉල්ලීම, ලබා ගැනීම හෝ අයකර ගැනීම; හෝ

(ආ) එවැනි යම් කාලසීමාවක් වෙනුවෙන් ඒ ස්ථානයේ ගෙවල් කුලිය, ඒ නියමිත ගෙවල් කුලියට වඩා අධික මුදලකට වැඩි කිරීම

නීත්‍යනුකූල නොවිය යුතු ය.

(2) යම් ස්ථානයක කුලී නිවැසියකු විසින්, ඒ ස්ථානයේ ගෙවල් කුලිය වශයෙන්, මේ පනතේ කාර්ය සඳහා 6 වන වගන්තියෙහි විස්තර කෙරෙන ඒ ස්ථානය සඳහා වූ ගෙවල් කුලියට අධික වූ යම් මුදලක් ගෙවීම හෝ ගෙවීමට ඉදිරිපත් වීම හෝ නීත්‍යනුකූල නොවිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන, 5 වන සහ 6 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන, 5 වන සහ 6 වන වගන්ති ප්‍රතිස්ථාපනය කිරීම.

"සම්මත ගෙවල් කුලිය. 4. (1) 1969 ජනවාරි මස පළමුවන දිනයට පසුව නොවූ දිනයකින් ආරම්භ වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම පිළිබඳ ප්‍රථම තක්සේරුව කරනු ලැබූ ද වාර්ෂික වටිනාකම අදාළ මුදල නොඉක්මවන්නාවූ ද යම් නිවාස ස්ථානයක සහ වාර්ෂික වටිනාකම අදාළ මුදල නොඉක්මවන යම් ව්‍යාපාර ස්ථානයක සම්මත වාර්ෂික ගෙවල් කුලිය යත්හොත්—

2-

(අ) 1968 ජනවාරි මාසය තුළ වලංගුව පැවති තක්සේරුවෙහි සඳහන් ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකමෙහි මුදල නැත හොත් ඒ ස්ථානයෙහි වාර්ෂික වටිනාකම පිළිබඳ තක්සේරුව ප්‍රථම වරට කරන ලද්දේ ඒ මාසයෙන් පසුව නම් ඒ ප්‍රථම තක්සේරුවෙහි සඳහන් ඒ වාර්ෂික වටිනාකමෙහි මුදල ; සහ

(ආ) ඒ ස්ථානය වෙනුවෙන් අය කරනු ලබන වරිපනම්, කුලී නිවැසියාවයේ නියමයන් යටතේ, ගෙහිමියා විසින් ගෙවිය යුතු නම්, ආ) ගෙද්දය යටතේ නිශ්චය කරන ලද මුදලෙහි සහ තත්කාලයෙහි ඒ ස්ථානය වෙනුවෙන් වරිපනම් වශයෙන් වර්ෂයකට ගෙවිය යුතු මුදලෙහි මුළු එකතුව

අදහස් වේ.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ස්ථානයක් නොවන යම් නිවාස ස්ථානයක සම්මත වාර්ෂික ගෙවල් කුලිය යන්නෙන්—

(අ) ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකමෙහි මුදලෙහි ; සහ

(ආ) ඒ ස්ථානය වෙනුවෙන් වරිපනම් වශයෙන් වර්ෂයකට ගෙවිය යුතු මුදලෙහි

මුළු එකතුව අදහස් වේ.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවන යම් ස්ථානයක් සම්බන්ධයෙන් වන විට, ඒ ස්ථානයේ සම්මත වාර්ෂික ගෙවල් කුලිය යන්නෙන්, තත් කාලයෙහි ඒ ස්ථානයේ ගෙහිමියා විසින් හෝ කුලී නිවැසියා විසින් හෝ කරනු ලබන ඉල්ලීමක් මත මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවල් කුලියක් අදහස් වේ.

(4) යම් ස්ථානයක මාසික හෝ ත්‍රෛමාසික හෝ අර්ධ වාර්ෂික සම්මත ගෙවල් කුලිය ඒ ස්ථානයේ සම්මත වාර්ෂික ගෙවල් කුලියට සමානුපාතිකව නිශ්චය කරනු ලැබිය යුතු ය.

අවසරලෙස් වැඩි කිරීම.

5. (1) යම් ස්ථානයක ගෙහිමියා, මේ පනතේ කාර්ය සඳහා ඒ ස්ථානයෙහි සම්මත ගෙවල් කුලිය නිශ්චය කිරීමට ගණන් ගත් දිනයෙන් පසුව ස්ථානය වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ එහි ව්‍යුහය වෙනස් කිරීම සඳහා (සැරසීම් සඳහා වූ වියදම් ඇතුළත් නොකර) වියදමක් දරා ඇති හෝ මින් මතු දරන හෝ අවස්ථාවක—



(අ) ඒ වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ එහි ව්‍යුහය වෙනස් කිරීම සිදු කිරීමට කුලී නිවැසියාගේ පූර්ව අනුමතය ගෙහිමියා විසින් ලබා ගෙන ඇත්තා වූ ද එහි ලා වියදම් කරනු ලබන මුදල් ප්‍රමාණය පිළිබඳව ඒ කුලී නිවැසියා එකඟත්වය දක්වා ඇත්තා වූ ද කවර හෝ විටක ; නැතහොත්

(ආ) ඒ වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ එහි ව්‍යුහය වෙනස් කිරීම සිදු කිරීමට ස්වකීය අනුමතය දීමෙන් කුලී නිවැසියා වැළකී සිටියා වූ ද මණ්ඩලය විසින් බලය දෙන ලද යම් මුදල් ප්‍රමාණය කට ඒ වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ එහි ව්‍යුහය වෙනස් කිරීම සිදු කිරීමට මණ්ඩලයේ පූර්ව අනුමතය ගෙහිමියා විසින් ලබා ගෙන ඇත්තා වූ ද කවර හෝ විටක

ඒ ස්ථානයේ වාර්ෂික සම්මත ගෙවල් කුලිය, එසේ දරන ලද වියදමෙහි ප්‍රමාණයෙන් එක් එක් වර්ෂය සඳහා සියයට විසිපහ බැගින් අවුරුදු පහක කාල පරිච්ඡේදයකට වැඩි කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, කුලී නිවැසියා සමග එළඹුණු ගිවිසුමට නැතහොත් මණ්ඩලය විසින් දෙන ලද බලයට අනුකූලව ඒ වැඩි දියුණු කිරීම, අලුත්වැඩියා කිරීම හෝ එහි ව්‍යුහය වෙනස් කිරීම සිදු නොකිරීමේ හේතුව මත, ඒ ස්ථානයෙහි කුලී නිවැසියා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, මෙහි ඉහතින් විධිවිධාන සලසා ඇති පරිදි සම්මත ගෙවල් කුලිය වැඩි කරනු නොලැබිය යුතු යයි මණ්ඩලය විසින් විධාන කළ හැකි ය ; නැතහොත් සම්මත ගෙවල් කුලිය එසේ වැඩි කරනු ලැබිය හැකි මුදලේ ප්‍රමාණය අඩු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් ස්ථානයක, වැඩි කරන ලද යම් ගෙවල් කුලියක් මේ පනතේ කාර්ය සඳහා අවසර ලත් වැඩි කිරීමක් විය යුතු ය.

නියමිත ගෙවල් කුලිය.

6. මේ පනතේ කාර්ය සඳහා යම් ස්ථානයක නියමිත ගෙවල් කුලිය, 4 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද ඒ ස්ථානයේ සම්මත ගෙවල් කුලිය හෝ ඒ ස්ථානය සම්බන්ධයෙන් යම් ගෙවල් කුලී වැඩි කිරීමකට 5 වන වගන්තියෙන්

අවසර දෙනු ලැබූ අවස්ථාවක නම් ඒ සම්මත ගෙවල් කුලියෙහි සහ එවැනි සෑම අවසරලත් වැඩි කිරීමක මුළු එකතුව හෝ විය යුතු ය:

එසේ වුව ද යම් ස්ථානයක නියමිත ගෙවල් කුලිය, 1972 මාර්තු මස 1 වන දින බලාත්මක වූ මේ පනතේ විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, ඒ ස්ථානයේ නියමිත ගෙවල් කුලියට හෝ ලැබිය හැකි ගෙවල් කුලියට හෝ අඩු නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඉවත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර මේ පනත ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයෙහි අලුත්වැඩියා අරමුදලේ බැරට තිබූ සියලු මුදල්, ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ජාතික නිවාස අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) මාස තුනක කාලසීමාවක් සඳහා නිශ්චිත ගෙවල් කුලිය ඉක්මවන යම් මුදලක් ගෙවල් කුලී අත්තිකාරම් වශයෙන්; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(6) යම් ස්ථානයක් හෝ එහි යම් කොටසක් අතයට කුලියට දී ඇති ඒ ස්ථානයේ කුලී නිවැසියා විසින්, අතයට කුලියට දෙන ලද ස්ථානය හෝ එහි කොටස වෙනුවෙන් නියමිත ගෙවල් කුලිය ඉක්මවන යම් මුදලක් හෝ අතයට කුලියට දෙන ලද කොටසෙහි අනුපාතික ගෙවල් කුලිය වශයෙන් මණ්ඩලය විසින් නියම කර ඇති මුදල ඉක්මවන යම් මුදලක් හෝ ලබා ගන්නා වූ නැතහොත් අයකර ගන්නා වූ හෝ නියමිත ගෙවල් කුලියට නැතහොත් අනුපාතික ගෙවල් කුලියට අතිරේකව යම් තෑගි මුදලක්, කොමිස් මුදලක්, පාරිතෝෂිකයක් හෝ එවැනි වෙනත් ගෙවීමක් නැතහොත් කවර අන්දමේ හෝ මුදලින් වූ ප්‍රතිෂ්ඨාවක් ලබා ගන්නා වූ නැතහොත් අයකර ගන්නා අවස්ථාවක ඒ කුලී නිවැසියා මේ පනත යටතේ වරදක්



කරන අතර, 22 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක පවරනු ලැබූ නඩුවක දී ඒ කුලී නිවැසියා ඒ ස්ථානයෙන් නෙරපීම සඳහා වූ තීන්දු ප්‍රකාශයකට ඒ ස්ථානයේ ගෙහිමියා හිමිකම් ලැබිය යුතු ය."; තවද

(2) ඒ වගන්තියේ (12) වන සහ (13) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:—

"(12) අනුපාතික ගෙවල් කුලිය නියම කිරීම සඳහා (2) (ඈ) (ii) වන උපවගන්තිය හෝ (9) වන උපවගන්තිය හෝ යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් විභාග කර නිශ්චය කිරීමට මණ්ඩලය විසින් මණ්ඩලය ඉදිරියෙහි ඇති වෙනත් කටයුතු අභිභවා ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඒ ගෙවල් කුලිය නියමිත ගෙවල් කුලියෙන් සියයට එකසිය විස්සක පදනම මත මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(13) වරිපණම්වල කාර්යය සඳහා වෙන වෙන ම තක්සේරු නොකරන ලද වෙන් වෙන් කොටස් වශයෙන්, යම් ස්ථානයක් කුලියට හෝ අතයට කුලියට හෝ පදිංචියට දෙනු ලැබ ඇත්තා වූ ද ඒ වෙන් වෙන් කොටස් සඳහා ගෙවල් කුලිය වශයෙන් ඉල්ලා සිටින මුදලෙහි මුළු එකතුව ඒ ස්ථානයේ නියමිත ගෙවල් කුලිය ඉක්මවන්නා වූ ද අවස්ථාවක මේ පනතේ 3 වන වගන්තියෙහි විධිවිධාන ගෙහිමියා විසින් කඩ කර ඇතැයි සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද එවැනි යම් ස්ථානයක් මේ පනත ආරම්භ වීමේ දිනයෙහි හෝ එදිනට පසු වෙන් වෙන් කොටස් වශයෙන් කුලියට හෝ අතයට කුලියට හෝ පදිංචියට දෙනු ලබන අවස්ථාවක, ඒ වෙන් වෙන් කොටස් සඳහා ගෙවල් කුලිය වශයෙන් ඉල්ලා සිටින මුදලෙහි මුළු එකතුව, ඒ ස්ථානයේ නියමිත ගෙවල් කුලියෙන් සියයට එකසිය විස්සක් නොඉක්මවන්නේ නම් ගෙහිමියා විසින් ඒ විධිවිධාන කඩ කර ඇතැයි සලකනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"කුලී නිවැසියන්ට බලහත්කාරයෙන් ඇතුළු සහ ස්ථානවලට අලාභහානි සිදු කිරීම.

16. යම් ස්ථානයක හිමි ම ගෙහිමියකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින්, තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් කෙළින් ම හෝ අනාකාරයකින් ඒ ස්ථානයෙහි කුලී නිවැසියා හෝ එහි පදිංචි යම් තැනැත්තකු ඒ ස්ථානය හැර යාමට හෝ ඒ ස්ථානයේ නියමිත ගෙවල් කුලිය නැතහොත් ඒ ස්ථානයේ යම් කොටසක අනුපාතික ගෙවල් කුලිය ඉක්මවන

යම් මුදලක් ගෙවීමට පෙළඹවීම පිණිස හෝ, එසේ කිරීමට ඔහුට බල කිරීම පිණිස නැතහොත් එසේ කිරීමට ඔහු කැමති කරවා ගැනීම පිණිස ඒ ස්ථානයෙහි කුලී නිවැසියා හෝ ඒ නෑනැත්තා විෂයයෙහි නැතහොත් ඒ කුලී නිවැසියාට හෝ නෑනැත්තාට විරුද්ධව යම් බලගත්කාරකමක් හෝ සාහසික කමක් පෑම හෝ යම් අවහිරයක් කිරීම හෝ, එසේ කරන බවට තර්ජනය කිරීම හෝ, යම් අනතුරක්, අලාභහානියක් නැතහොත් පාඩුවක් කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම නැතහොත්, ඒ ස්ථානයෙහි කිසියම් කොටසකට අලාභහානි කිරීම, එය ඉවත් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අයුතු යමක් කිරීම හෝ නොකළ යුතු ය.".

ප්‍රධාන පනතේ 18 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 18 අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"අවුරුදු පණහකට වඩා පැරණි ගොඩනැගිලි කඩා දැමීම.

18අ. (1) (අ) පදිංචිවීමේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද ඉල්ලුම් පත්‍රයේ දිනයට සවත් පිරී සෙයින් අවුරුදු පණහකට පෙර ඉදි කරන ලද්දා වූ ද යම් ගොඩනැගිල්ලක අයිතිකරු විසින් තත් කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත ;

(ආ) ඒ ගොඩනැගිල්ලෙහි පදිංචිකරු වන්ට කරුණු කියා සිටීමට අවස්ථාවක් සලසා දීමෙන් පසුව,

ඒ ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම වඩාත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීම සඳහා, ඒ ඉඩම ප්‍රතිසංවර්ධනය කිරීම අවශ්‍ය යයි ජාතික නිවාස කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඒ ගොඩනැගිල්ල කඩා දැමීමට ඒ අයිතිකරුට බලය දෙමින් කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) ගොඩනැගිල්ලක් කඩා දැමීමට, ඒ ගොඩනැගිල්ලෙහි අයිතිකරුට බලය දෙමින් ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලබන අවස්ථාවක, ඒ කොමසාරිස්වරයා විසින්—

(අ) කඩා දමන ලද ගොඩනැගිල්ල පිහිටා තිබුණ ඉඩමෙහි කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් හෝ කාල



සීමා ඇතුළත ඒ අයිතිකරු විසින් ඉදි කරනු ලැබිය යුතු නිවාස ඒකක සංඛ්‍යාව ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) (i) ඒ ගොඩනැගිල්ලෙහි කිසියම් කුලී නිවැසියකු සිටි නම් ඒ කුලී නිවැසියාට විකල්ප නිවාස පහසුකම් ඉඩ කඩ සැලසිය යුතු ය ; නැතහොත්

(ii) එම කුලී නිවැසියාගේ සන්තකය නැති වීම සම්බන්ධයෙන් සාධාරණ යයි කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන යම් වන්දියක් ඒ ගොඩනැගිල්ලෙහි කුලී නිවැසියාට ගෙවන ලෙස ඒ ගොඩනැගිල්ලෙහි අයිතිකරුට නියම කළ යුතු ය ; කෙසේ වුව ද එසේ ගෙවන ලෙස නියම කරනු ලබන මුදල කිසිම අවස්ථාවක ගොඩනැගිල්ලෙහි වාර්ෂික නියමිත කුලියේ තුන් ගුණයකට වඩා අඩු නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ද ඒ ගොඩනැගිල්ලේ ප්‍රකටව පෙනෙන කොටසක ඒ නියමය ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් අලවා තබනු ලැබුවහොත්, ඒ නියමය ඒ ගොඩනැගිල්ලෙහි සෑම පදිංචිකරුවකු වෙත ම යථා පරිදි දන්වා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ද ඒ ගොඩනැගිල්ලෙහි සෑම පදිංචිකරුවකු ම, (2)(ආ)(i) වන උපවගන්තියෙහි හෝ (2)(ආ)(ii) වන උපවගන්තියෙහි හෝ විධිවිධාන අනුව ක්‍රියා කිරීමෙන් ඉක්බිති දින අනූවක් ඉකුත් වීමට පෙර, ඒ ගොඩනැගිල්ලෙන් ඉවත්ව යා යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ද ඒ ගොඩනැගිල්ලෙහි පදිංචිකරු (4) වන උපවගන්තියෙහි විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ ගොඩනැගිල්ලෙහි අයිතිකරු විසින්, මේ පනතෙහි කුමක් සඳහන්ව ඇත ද, ඒ ගොඩනැගිල්ලෙහි සන්තකය නැවත ලබා දෙන ලෙස ද ඒ පදිංචිකරු එතැනින් නෙරපන ලෙස ද අයදිමින් ඒ ගොඩනැගිල්ල පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

එවැනි සෑම ඉල්ලීමක් ම, විභාග කොට තීරණය කිරීම සම්බන්ධයෙන්, 23 වන වගන්තියේ (3) වන, (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් කරනු ලබන තීරණයක්, මේ වගන්තිය යටතේ වූ කිසිම නඩු කටයුත්තක දී අධිකරණය විසින් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය; නැතහොත් පරීක්ෂා කරනු නො ලැබිය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් හෝ කාලසීමා ඇතුළත නිවාස ඒකක සංඛ්‍යාව ඉදි කිරීම ගොඩනැගිල්ලක අයිතිකරු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, අදාළ ඉඩම් ප්‍රමාණය ජාතික නිවාස පනතේ VIII වන කොටස යටතේ ආඥාවුව විසින් අත්කර ගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 20අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ප්‍රමාණය පර්චස් අටක් ඉක්මවන අබද්ධ ඉඩම්වල අතිරේක නිවාස ඒකක ඉදිකිරීම.

20අ. (1) යම් ස්ථානයක සීමා ඇතුළත, ප්‍රමාණයෙන් පර්චස් අටක් ඉක්මවන ආබද්ධ ඉඩම් තිබෙන අවස්ථාවක, ඒ ඉඩමෙහි නිවාස කාර්ය සඳහා කිසියම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ නිවාස කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය හැකි කිසියම් එකතු කිරීම් පවත්නා ගොඩනැගිලිවලට කිරීම හෝ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, මේ පනතෙහි හෝ වෙනත් කිසියම් නීතියක කුමක් සඳහන් ව ඇත ද, එසේ කිරීමට ඒ ස්ථානයෙහි ගෙහිමියා වෙත බලය දෙමින් ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද—

(අ) කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන කාලසීමාව නැතහොත් කාලසීමා වක් ඇතුළත නිවාස ඒකක සංඛ්‍යාව ඉදි කිරීමේ මූල්‍ය ශක්තිය ඉල්ලුම්කරුට තිබෙන බවට; සහ

(ආ) ඉදිකිරීමට අදහස් කරනු ලබන ගොඩනැගිල්ල හෝ කිරීමට අදහස් කරනු ලබන එකතු කිරීම හෝ කුලී නිවැසියා භුක්ති විඳින සැප විහරණ ක්‍රමවලට සහ පහසුකම්වලට අයහපත් ලෙස බලපානු නොලබන බවට



හෝ, ඒ සැප විහරණ ක්‍රම නැතහොත් පහසුකම් කෙරෙහි බලපානු ලැබිය හැකි අවස්ථාවක, ඒ ඉඩම තම සන්තකයට ගැනීමට පෙර ගෙහිමියා විසින් කුලී නිවැසියා වෙත ප්‍රමාණවත් සැප විහරණ ක්‍රම සහ පහසුකම් අලුතින් සපයන බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත් මිස, එවැනි කිසිදු නියමයක් කොමසාරිස්වරයා විසින් කරනු නොලැබිය යුතු ය.

මේ උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම ඒ ස්ථානයේ කුලී නිවැසියා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. තව ද ඒ නියමයෙහි සඳහන් කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා හෝ ගොඩනැගිල්ලට කිසියම් එකතු කිරීම් සඳහා හෝ ඒ ස්ථානයේ ගෙහිමියාට ඉඩදීම, ඒ කුලී නිවැසියාගේ කාර්ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ කුලී නිවැසියා විසින්, ඒ නියමයෙහි සඳහන් කිසියම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට හෝ ගොඩනැගිල්ලට කිසියම් එකතු කිරීමක් කිරීමට හෝ ඒ ස්ථානයේ ගෙහිමියාට ඉඩදීම් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ඒ ස්ථානය පිහිටා ඇත්තේ යම් මහේස්ත්‍රාත් අධිකරණ කොට්ඨාසයක් තුළ ද, ඒ කොට්ඨාසයෙහි ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත පහත දැක්වෙන කරුණු සඳහන් කරමින්, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය; ඒ කරුණු නම්—

(අ) ඒ ස්ථානය ඇතුළත ආබද්ධ ඉඩමෙහි නිවාස කාර්ය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හෝ නිවාස කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය හැකි යම් එකතු කිරීම් පවත්නා ගොඩනැගිලිවලට කිරීමට හෝ ඒ ස්ථානයේ ගෙහිමියාට බලය දෙමින් තමා විසින් නියමයක් කරන ලද බව;

(ආ) ඒ නියමය, ඒ ස්ථානයේ කුලී නිවැසියා වෙත යවන ලද බව;

(ඇ) ඒ ගොඩනැගිල්ල ඉදි කිරීමට හෝ ඒ එකතු කිරීම කිරීමට හෝ ඒ ගෙහිමියාට ඉඩදීම, ඒ කුලී නිවැසියා විසින් ප්‍රතික්ෂේප කරන ලද බව;

(ඈ) සහතිකයෙහි සඳහන් කරන ලද (මේ වගන්තියේ මින් මතු "අදාළ ඉඩම් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ ස්ථා

නය ඇතුළත වූ ආබද්ධ ඉඩමේ ඒ කොටස පිළිබඳ සන්තකය ඒ ස්ථානයේ ගෙහිමියාට බාර දෙන ලෙස ඉල්ලා සිටින බව.

(3) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සහතිකයක් ම, එහි සඳහන් කර ඇති කරුණු පිළිබඳව මුල් බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලැබුණු විට, මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් අදාළ ඉඩම් ප්‍රමාණය පිහිටි දිස්ත්‍රික්කයෙහි පිස්කල්වරයා වෙත සන්තකයට ගැනීමේ රිට් ආඥාවක් නොපමාව නිකුත් කිරීමෙන් හා අවශ්‍ය නම්, නැවත නිකුත් කිරීමෙන්, ඒ රිට් ආඥාව නිකුත් කළ දිනයට සම්පූර්ණ දින තුනකට කලින් නොවූ ද සම්පූර්ණ දින හතකට පසුව නොවූ ද දිනයක් විය යුතු ඒ රිට් ආඥාවෙහි සඳහන් දිනයකට පෙර, ඒ අදාළ ඉඩම් ප්‍රමාණයේ සන්තකය, (2) වන උපවගන්තිය යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයෙහි සඳහන් තැනැත්තාට බාර දෙන ලෙස ඒ පිස්කල්වරයාට නියම කළ යුතු අතර, එසේ කිරීමට බලය පැවරිය යුතු ය. තව ද, ඒ පිස්කල්වරයා විසින් නැතහොත් ඔහු විසින් බලය පවරන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යැයි සලකනු ලබන සහායකයන් සමග ඒ ඉඩමෙහි අදාළ ඉඩම් ප්‍රමාණයට ඇතුළුවීමට සහ ඒ අනුව සන්තකය බාරදීමට, ඒ පිස්කල්වරයාට හෝ ඒ නිලධරයාට ඒ රිට් ආඥාව ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද නිවාස ඒකක සංඛ්‍යාව, ඒ උපවගන්තිය යටතේ තීරණය කරන ලද කාලසීමාව ඇතුළත හෝ ගෙහිමියා විසින් කරන ලද ඉල්ලීමක් මත කොමසාරිස්වරයා විසින් දීර්ඝ කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් ඇතුළත හෝ සාධාරණ හේතුවක් නොමැතිව, ඉදි කරනු නොලබන අවස්ථාවක, අදාළ ඉඩම් ප්‍රමාණය, ජාතික නිවාස පනතේ VIII වන කොටස යටතේ ආණ්ඩුව විසින් අත්කර ගනු ලැබිය යුතු ය.".



12. 1977 අංක 10 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(1ඇ) (1ආ) උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් ලබා දෙන ලද විකල්ප නිවාස පහසුකම්වල ප්‍රමාණවත්කම හෝ ඒවායේ යෝග්‍යතාව හෝ පිළිබඳව අධිකරණය විසින් විභාග කරනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආආ) මේ පනත ආරම්භ වූ දිනයට පෙර හෝ පසුව හෝ වුව ද කුලී නිවැසියකුට කුලියට දෙන ලද ස්ථානයක් සම්බන්ධයෙන් වූ විට සහ ගෙහිමියා, එක් නිවාස ස්ථානයකට වඩා වැඩි නොවන ගණනක අයිතිකරු වන අවස්ථාවක—

(i) අධිකරණයේ මතය අනුව, ඒ ස්ථානය ගෙහිමියාගේ හෝ ගෙහිමියාගේ පවුලේ යම් සාමාජිකයකුගේ හෝ පදිංචිය සඳහා වාසස්ථානයක් වශයෙන් යුක්තිසහගතව අවශ්‍ය බවට ; හෝ

(ii) කුලී නිවැසියාට ගෙවීම පිණිස, අවුරුදු පහක ගෙවල් කුලියට සමාන මුදලක්, ඒ නඩුව හෝ නඩු කටයුත්ත පැවරීමට පෙර, ඒ ස්ථානයේ ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර ඇති බවට ; හෝ";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (2) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි සඳහන් කිසියම් ස්ථානයකින් කුලී නිවැසියා නෙරපීම සඳහා එම ඡේදයෙහි සඳහන් හේතුවලින් කිසිවක් මත, යම් අධිකරණයක් විසින් තීන්දු ප්‍රකාශයක් පවසන් කරනු ලබන අවස්ථාවක, ඒ ස්ථානයේ නිරවුල් භුක්තිය, ඒ ස්ථානයේ ගෙහිමියාට බාර දෙන ලෙස නියම කරමින් සහ එසේ බාරදීමට බලය පවරමින් එම තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ඒ අධිකරණය විසින්, ඒ අධිකරණයේ පිස්කල්වරයා වෙත නොපමාව නිකුත් කරනු ලැබිය යුතු ය.

(2ආ) (2) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි සඳහන් යම් ස්ථානයක කුලී නිවැසියා නෙරපීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා වූ රිට් ආඥාවක් යම් අධිකරණයක් විසින් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, ඒ අධිකරණයේ නඩු තීන්දුව සම්බන්ධයෙන් යම් අභියාචනයක් කර තිබීමේ හේතුවෙන් ඒ රිට් ආඥාව ක්‍රියාවේ යෙදවීම, කවර ආකාරයකින්වත් නතර කරනු නොලැබිය යුතු ය.

(2ඇ) (2) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි සඳහන් යම් ස්ථානයක කුලී නිවැසියා ඉවත් කිරීම සඳහා යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් යම් අධිකරණයක පවරනු ලැබ ඇති අවස්ථාවක, එම අධිකරණයේ වෙනත් සියලු කටයුතු අභිභවා ප්‍රමුඛත්වයක් ඒ නඩුව හෝ නඩු කටයුත්ත සඳහා ලැබිය යුතු අතර, කෙසේ වුව ද, ඒ නඩුව හෝ නඩු කටයුත්ත පවරනු ලැබූ දින සිට මාස දෙළහක කාලයක් ඇතුළත, ඊට සුදුස්සක් කරනු ලැබිය යුතු ය.";

(4) ඒ වගන්තියේ (6) වන උපවගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට, පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද (1) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි හෝ (2) වන උපවගන්තියේ (ආආ) ඡේදයෙහි හෝ සඳහන් යම් ස්ථානයක ගෙහිමියා විසින්, ඒ ස්ථානයේ ඒ කුලී නිවැසියාගේ කුලී නිවැසිභාවය අවසන් කිරීම පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් මාස හයක් කල් තබා ඒ කුලී නිවැසියා වෙත දෙනු ලැබ ඇත්නම්, ඒ කුලී නිවැසියා නෙරපීම සඳහා නඩුවක් හෝ නඩු කටයුත්තක් ඒ ගෙහිමියා විසින් පවරනු ලැබිය හැකි ය."; තවද

(5) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(7) (1) වන උපවගන්තියෙහි හෝ (2) (i) වන උපවගන්තියෙහි සඳහන් යම් ස්ථානයක අයිතිය, ගෙහිමියා විසින්, නියමිත දිනයට තදනන්තර දිනයක, මිලට ගැනීමකින් හෝ, නියමිත දිනයට පෙරාතුව වූ දිනයක ඒ ස්ථානයෙහි අයිතිය ලබාගෙන සිටි දෙමව්පියන්ගෙන් හෝ අඹුසැමියන්ගෙන් කෙනකුගෙන් ලැබුණු උරුමයක් හෝ තෑග්ගක් නොවන උරුමයක් හෝ තෑග්ගක් මගින් හෝ, අත්කර ගෙන ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, එම ස්ථානයෙහි කුලී නිවැසියා නෙරපීම සඳහා කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක්—

(අ) ඒ ස්ථානය ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකුගේ හෝ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් නැතහොත් ගෙහිමියාගේ වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක නැතහොත් ඉස්වාමියුක්තියක කාර්ය සඳහා යුක්ති සහගත ලෙස අවශ්‍ය වීමේ හේතුව මත ; හෝ

(ආ) ගෙහිමියා නිවාස ස්ථාන එකකට නොවැඩි ගණනක අයිතිකරු වන අවස්ථාවක,—

(i) ඒ ස්ථානය ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුගේ හෝ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් යුක්තිසහගත ලෙස අවශ්‍ය වීමේ හේතුව මත ; හෝ

(ii) ඒ නඩුව හෝ නඩු කටයුත්ත පැවරීමට පෙරාතුව, අවුරුදු පහක ගෙවල් කුලියට සමාන මුදලක් කුලී නිවැසියාට ගෙවීම පිණිස, එම ස්ථානයේ ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර තිබීමේ හේතුව මත

පවරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව යම් කුලී නිවැසියකු අදාළ මුදලින් සියයට එකසිය පනහක් ඉක්මවන වාර්ෂික වටිනාකමක් ඇති යම් ස්ථානයක පදිංචියට පැමිණ ඇති අවස්ථාවක ඒ කුලී නිවැසියා නෙරපීම සඳහා වූ යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

මේ උපවගන්තියේ "නියමිත දිනය" යන්නෙන්, ස්ථානයෙහි තත්කාලයෙහි පදිංචිව සිටින කුලී නිවැසියා හෝ, තත්කාලයේ සිටින කුලී නිවැසියා මේ පනතේ 36 වන වගන්තිය යටතේ නැතහොත් (274 වන අධිකාරය වූ) ගෙවල් කුලී සීමා කිරීමේ පනතේ 18 වන වගන්තිය යටතේ කුලී නිවැසි භාවයට අනුප්‍රාප්තිය ලැබුවේ යම් කුලී නිවැසියකුගේ මරණය සිදු වූ විට ද ඒ කුලී නිවැසියා හෝ, ඒ ස්ථානයෙහි පදිංචියට පැමිණි දිනය අදහස් වේ.';

(6) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(8) (අ) ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුගේ හෝ පදිංචිය පිණිස වාසස්ථානයක් වශයෙන් නැතහොත් ගෙහිමියාගේ වෙළෙඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ, රක්ෂාවේ හෝ සේවයේ කාර්ය සඳහා යුක්ති සහගත ලෙස ස්ථානය අවශ්‍ය බව ; හෝ

(ආ) යම් ස්ථානයක ගෙහිමියා නිවාස ස්ථාන එකකට වැඩි ගණනක අයිතිකරු නොවන අවස්ථාවක, ඒ ස්ථානය සම්බන්ධයෙන් වූ විට,—

(i) ඒ ස්ථානය ගෙහිමියාගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකුගේ හෝ පදිංචිය

පිණිස වාසස්ථානයක් වශයෙන් යුක්තිසහගත ලෙස අවශ්‍ය බව; හෝ

(ii) ඒ ස්ථානයෙහි සම්මත කුලිය මසකට රුපියල් සියයක් ඉක්මවන අවස්ථාවක අවුරුදු පහක කුලියට සමාන මුදලක්, කුලී නිවැසියාට ගෙවීම පිණිස, ඒ ස්ථානයේ ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර ඇති බව

යම් අධිකරණයක මතය වීමේ හේතුව මත ඒ ස්ථානයේ කුලී නිවැසියා නෙරපීම සඳහා තීන්දු ප්‍රකාශයක් ඒ අධිකරණය විසින් සටහන් කරනු ලබන අවස්ථාවක, ගෙහිමියා හෝ ඒ තීන්දු ප්‍රකාශයෙහි නම සඳහන් කරනු ලබන ඔහුගේ පවුලේ සාමාජිකයන් කිසිවකු හෝ නොවන වෙනත් කිසිම තැනැත්තකු, ඒ ස්ථානයේ කුලී නිවැසියා අස්ව ගිය විට හෝ කුලී නිවැසියා ඒ ස්ථානයෙන් නෙරපනු ලැබූ විට හෝ ඒ ස්ථානයෙහි පදිංචියට නොපැමිණිය යුතු බවට අධිකරණය විසින් ඒ තීන්දු ප්‍රකාශයෙන් විධාන කරනු ලැබිය යුතු ය." ; තව ද

(7) ඒ වගන්තියේ (9) වන උපවගන්තියෙහි "යුක්තිසහගත හේතුවක් නොමැතිව එය හැර යතහොත් එවිට," යන වචන වෙනුවට "යුක්තිසහගත හේතුවක් නොමැතිව එය හැර යතහොත් හෝ ඒ කාලසීමාව ඇතුළත ඒ ස්ථානය හෝ එහි කොටසක් කුලියට දෙනු ලැබුවහොත් එවිට," යන වචන ආදේශ කිරීමෙන්.".

13. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 30 වන වගන්තිය ඉවත් කිරීම.)*

14. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("නියමිත ගෙවල් කුලියට වැඩියෙන් කරන ලද ගෙවීම් ආපසු අයකර ගැනීම.)*

32. යම් ස්ථානයක යම් කුලී නිවැසියකු විසින් යම් කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, ඒ ස්ථානයේ හෝ එහි කොටසක හෝ නියමිත ගෙවල් කුලියට හෝ අනුපාතික ගෙවල් කුලියට හෝ වැඩියෙන් යම් මුදලක් ගෙවල් කුලී වශයෙන් ගෙහිමියාට ගෙවා තිබෙන අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවා ඇති මුදල ගෙහිමියාගෙන් ආපසු අයකර ගැනීමේ හිමිකම ඒ කුලී නිවැසියා සතු විය යුතු අතර ඒ මුදල අයකර ගැනීමේ වෙනත් යම් ක්‍රමයකට හානි නොවන පරිදි, ඔහු විසින් ගෙහිමියාට ගෙවිය යුතු ගෙවල් කුලියෙන් එකී වැඩිපුර මුදල අඩුකර ගනු ලැබිය හැකි ය.".



15. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(1) යම් ස්ථානයක කුලී නිවැසියා විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටි විටක දී ඒ ස්ථානයේ සම්මත ගෙවල් කුලිය ද අවසර ලත් වැඩි කිරීමක් බවට ගෙහිමියා විසින් හිමිකම් පාන යම් ගෙවල් කුලී වැඩි කිරීමක ප්‍රමාණය ද අදාළ අවස්ථාවක, ඒ ස්ථානයේ යම් කොටසක් සඳහා වූ අනුපාතික කුලිය ද දැක්වෙන ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් ඒ ස්ථානයේ ගෙහිමියා විසින් කුලී නිවැසියා වෙත සපයනු ලැබිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("නියමිත ගෙවල් කුලිය නිර්ණය කිරීමට මණ්ඩලය සතු බලය.)*

34. යම් ස්ථානයක ගෙහිමියා විසින් හෝ කුලී නිවැසියා විසින් හෝ ඒ ස්ථානයෙහි නියමිත ගෙවල් කුලිය නිර්ණය කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබුවහොත්, ඒ ස්ථානය සඳහා නියමිත ගෙවල් කුලිය, මණ්ඩලය විසින් නියමයක් මගින් නිර්ණය කරනු ලැබිය හැකි ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදය අත් හැරීමෙන් ; සහ

(2) ඒ උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) යන ඡේද, ඒ උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) යන ඡේද ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "7(2); 9(1)" යන ඉලක්කම් වෙනුවට "9 (1)" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

19. 44 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 44අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— *(44අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.)*

*("ජාතික නිවාස කොමසාරිස්වරයාගේ බලතල පවරා දීම.)*

44අ. (1) මේ පනතේ යම් විධිවිධානයක් මගින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත පවරා ඇති, නියමකර ඇති නැතහොත් වෙන් කර ඇති බලතල, කර්තව්‍ය නැතහොත් කාර්ය කිසිවක්, ඔහු විසින් පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා වෙත හෝ පරිපාලන කොට්ඨාසයක උප දිසාපතිවරයා වෙත හෝ පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික්කයක දිසාපතිවරයා හෝ පරිපාලන කොට්ඨාසයක උප දිසාපතිවරයකු වෙත හෝ ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දිසාපතිවරයා නැතහොත් උප දිසාපතිවරයා විසින්, ජාතික නිවාස කොමසාරිස්වරයා විසින්, කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ යම් විධානවලට යටත්ව, තම පත්වීම අදාළ වන පරිපාලන දිස්ත්‍රික්කයෙහි හෝ කොට්ඨාසයෙහි සීමා තුළ වූ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ඒ බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියෙහි "ප්‍රාදේශීය බල මණ්ඩලය" යන අර්ථ කථනය වෙනුවට, පහත දක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "පළාත් පාලන ආයතනය" යන්නෙන්—

(අ) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ පිහිටුවන ලද යම් සංවර්ධන සභාවක් හෝ යම් නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ඇති කොට පිහිටුවනු ලැබුවා වූ ද, මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, සුළු නගර සභා ආඥාපනත සහ ගම්සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ යම් මහ නගර සභාවක, නගර සභාවක, සුළු නගර සභාවක සහ ගම් සභා වක බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම පැවරී ඇත්තා වූ ද වෙනත් යම් අධිකාරියක්, මණ්ඩලයක් නැතහොත් ආයතනයක් අදහස් වේ; තව ද

(ආ) යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් අදහස් වේ.'.

විනිශ්චයට භාජනව පවත්නා නඩු.

21. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) (අා) උප වගන්තිය යටතේ කිසියම් ස්ථානයකින් කුලී නිවැසියකු නෙරපීම සඳහා යම් අධිකරණයක පවරන ලද නඩුවක් හෝ නඩු කටයුතු මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි විනිශ්චයට භාජනව තිබෙන අවස්ථාවක, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) (ආආ) උපවගන්තියෙහි සඳහන් යම් අලුත් හේතුවක් දක්වා සිටීමට එම ස්ථානයේ ගෙහිමියා අදහස් කරයි නම්, පැමිණිල්ල සංශෝධනය කිරීම පිණිස ඔහු විසින් අධිකරණයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එවිට ඒ ස්ථානයේ අවුරුදු පහක ගෙවල් කුලියට සමාන මුදලක්, ඒ ස්ථානයේ කුලී නිවැසියා වෙත ගෙවීම පිණිස, ගෙහිමියා විසින් ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත තැන්පත් කර ඇති බවට අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, වෙනත්, යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද ඒ අධිකරණය විසින් ඒ නඩුවේ නැතහොත් නඩු කටයුත්තේ පැමිණිල්ල සංශෝධනය කිරීමට ගෙහිමියාට අවසර දී අවශ්‍ය විය හැකි වෙනත් ආඥාවක් කරනු ලැබිය යුතු අතර, ඉදිරිපත් කරන ලද අලුත් හේතුව මත නඩුව හෝ නඩු කටයුත්ත විභාග කර තීරණය කිරීමට අධිකරණය විසින් ක්‍රියා කොට, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට අනුකූලව ආඥාවක් කළ යුතු ය.



(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) (අා) උප වගන්තිය යටතේ පවරන ලද යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අධිකරණයක යම් නඩු තීන්දුවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ වෙත කරන ලද යම් අභියාචනයක් අවස්ථාවෝචිත පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හෝ අභියාචනාධිකරණයෙහි විනිශ්චයට භාජනව ඇති අවස්ථාවක, ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) (ආආ) උපවගන්තියේ සඳහන් යම් අලුත් හේතුවක් දක්වා සිටීමට තමා අදහස් කරන බවට, ඒ ස්ථානයේ ගෙහිමියා විසින් කරනු ලබන ඉල්ලීමක් මත, අවස්ථාවෝචිත පරිදි, ඒ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ ඒ අභියාචනාධිකරණය විසින් වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද, එය සුදුසු යයි සලකන ආඥාවක් කිරීමෙන් පසු ඒ නඩුව මුල් අවස්ථා අධිකරණය වෙත ආපසු යවනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම් සහ බදු අවලංගු කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියෙහි හෝ වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද—

(i) ආගමික හා විශ්‍රාමික පනත යටතේ වලංගු වීසා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ ද එක් මාසයකට රුපියල් එක් දහසක් ඉක්මවන මුළු ආදායමක් ලබන්නා වූ ද නැනැත්තකු; හෝ

(ii) නේවාසික නොවන සමාගමක්

විසින් පදිංචියට ගෙන ඇති සහ එවැනි තැනැත්තකු හෝ සමාගමක් වෙත කුලියට දී ඇති කිසියම් පදිංචි ස්ථානයක කුලී නිවැසියාවය හෝ ගෙවල් කුලිය හෝ සම්බන්ධයෙන් මේ පනත ආරම්භ වීමට පෙර ඇතුළත් වූ බද්දක්, ප්‍රකාශිත නැතහොත් ගම්‍යමාන ගිවිසුමක් හෝ වෙනත් කොන්ත්‍රාත් ගිවිසුමක් මේ පනත ආරම්භ වන දින සිට බලරහිත හා අවලංගු ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.